**2025 දෙවන වාර පරීක්ෂණය**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය**

**II කොටස**

01.

1) නිර්මාණශීලි බව
2) මවට රසවත් පලතුරු බීම සකස් කිරිමට ඇති හැකියාව
   අවශ්‍ය පලතුරු ප්‍රදේශය තුළින් සපයාගත හැකවීම
3) Akila's fresh (සුදුසු ඕනෑම නමක්)
4) ස්භාවික සම්පත් - පලතුරු
   මානව සම්පත් - මවගේ පලපුරුද්ද
   (ශ්‍රමය)
5) නිවසින් පරිබාහිරව නගරයට යාබද ස්ථානයකට ව්‍යාපාරය ගෙනයාම
6) නව රසයෙන් යුතු සෞඛ්‍යදායි පලතුරු බීම නිෂ්පාදනය
7) සීනි රහිත වීම හා සෞඛ්‍යදායි බවෙන් යුක්තවීම
8) මවගේ බීම වල තිබූ රසවත් බව නිසා
9) නිවැරදි ගණුදෙනු වාර්තා කිරිම
   යහපත් මානව සම්බන්ධතා පැවැත්වීම
10) දිවයින පුරා තම නිෂ්පාදිත ප්‍රචලිත කිරිම

02.

1) ප්‍රාග්ධනය යනු - නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගන්නා මිනිසා විසින් නිර්මාණය කරන ලද නිෂ්පාදන ආධාරකයන්ය
   උදා - යන්ත්‍ර සූත්‍ර
2) විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටිම ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරිම
3) එකග වේ. ව්‍යවසායකයාගේ නවෝත්පාදනය සාර්ථක හෝ අසාර්ථක වීම පිළිබඳව ඇති අවිනිශ්චිත බව අවදානමයි. මෙය මූල්‍ය අවදානමකි. නවෝත්පාදන බිහි කිරිමේදී තමා යොදන මුදලට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබේද යන්න අවදානමකි.
4) නව සොයා ගැනිමක් - ගුවන් යානය , විදුලි බල්බය
   දිගුවක් - විදුලි දුම්රිය , මේද රහිත කිරි
5) නිර්මාණශීලිත්වය තුළින් නවෝත්පාදනයට මග පෙන්වීමක් සිදුවන අතර නවෝත්පාදනයේදි එම අදහස ක්‍රියාවට නැංවේ

03.

1)

| **අවශ්‍යතා** | **වුවමනා** |
|---|---|
| *. පොදුයි | * විවිධයි එක් එක් අයගේ පෞද්ගලිකත්වයට අනුව වෙනස් වේ |
| *. මුලින්ම පැන නගියි | *. අවශ්‍යතාවයෙන් පසු දෙවනුව පැන නගියි |

2) අරමුණ - ලාභ අරමුණු කරගත් මෙන්ම ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරද වේ
අවදානමක් පැවතීම – ව්‍යාපාර කටයුතු වලින් ලාභ මෙන්ම පාඩුද සිදුවිය හැක. මෙම අවිනිශ්චිතතාවයට ව්‍යාපාර වලට මුහුණ දීමට සිදුවේ

3) එකඟ වේ ව්‍යාපාරිකයා යන සංකල්පයට වඩා ව්‍යවසායකයා යන සංකල්පය තුළ නර්මාණශීලි බව ,අවදානම් අභියෝග ලෙස සැලසීම , අනාගත දැක්ම , සුබවාදි බව , තරඟයට ඇති කැමැත්ත , සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනිම ආදි සුවිශේෂ ලක්ෂණයන් දැකිය හැක. ව්‍යවසායක ව්‍යාපාරිකයා තම ව්‍යාපාර දිනෙන් දින ඉහළ මට්ටමකට රැගෙන යන අතර සාමාන්‍ය ව්‍යාපාරිකයෝ සාම්ප්‍රදායික ආකාරයට තම ව්‍යාපාර කරගෙන යති.

4) ව්‍යවසායකයින් වර්ග

- ව්‍යාපාර ව්‍යවසායකයින් - සිල්ලර වෙළෙන්දා
- සමාජීය ව්‍යවසායකයා - මාරි කියුරි මැතිණිය
- අභ්‍යන්තරික ව්‍යවසායකයින - එලදායිතා සම්මාන හිමිකරගත් විදුහල්වල ප්‍රධානීන්

5)

| **භාණ්ඩ** | **සේවා** |
|---|---|
| ස්පෘශ්‍යයි - භෞතික පැවැත්මක් ඇත | අස්පෘශ්‍යයි - භෞතික පැවැත්මක් නැත |
| ගබඩා කල හැක | ගබඩා කළ නොහැක |

04.

1) ව්‍යවසායකයා තම අදහස් ඉටු කරගනුයේ තමා අවට පරිසරය තුළිනි. ඔහු තම අවට පරිසරයේ පවත්නා භාවිතයට නොගත් සම්පත් භාවිතා කරමින් නව ව්‍යාපාර අවස්ථා ජනනය කරයි.
ව්‍යවසායකයා දේශීය සම්පත් උපයෝජනය කිරිම තුළින් භාණ්ඩ හා සේවා නිපදවීම හා ඒතුළින් පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරිමත් , ආර්ථිකමය වශයෙන් ලාභයක් ලබාගැනිමත් අපේක්ෂා කරයි.
2) ව්‍යවසායකයා නවෝත්පාදන බිහි කිරිම තුළින් රටේ භාණ්ඩ හා සේවා ප්‍රමාණය ඉහළ යයි
නව ව්‍යාපාරික අවස්ථා මෙන්ම රැකියා අවස්ථා බිහි වේ.
රැකියා වියුක්තිය පහළ ගොස් ජනතාවගේ ආදායම් තත්ත්වය යහපත් වි ජිවන මට්ටම උසස් වේ
ඉහත කරුණු අනුව ව්‍යවසායකයා රටක ආර්ථික සංවර්ධනයට දායක වේ
3) ආකර්ෂණිය ලාභයක් ලැබීම
නිදහස හා ඉහළ තෘප්තිය
කාර්යයන් හි විවිධත්වයක් ඇතිවීම
4) රජයේ සුබ සාධන කටයුතු වලට උපාකර කිරිම
නිවාස අහිමිවුවන්ට නිවාස ලබාදිම
පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදිම
5) රටක ආදායමෙන් වැඩි කොටසක් සුලු පිරිසක් අතර බෙදි යාම / ආදායම ජනගහනය අතර සමානව බෙදා නොයාම

05.

1) වෙළෙද පොළෙහි පාරිභෝගිකයන්ගෙන් කොටසක් තෘප්තිමත් නොවු අවශ්‍යතා හා වුවමනා සහිතව පසුවීම වෙළෙඳපොළ හිදැසයි
2) * ව්‍යාපාරයට ප්‍රාග්ධනය රැස්කරගන්නා මාර්ග සීමා වීම

* වෙළෙඳපොළ සීමාවීම

* නවීන තාක්ෂණය භාවිතා නොවීම

3) සංකල්පනාත්මක කුසලතා

   ව්‍යාපාරය සමස්තයක් ලෙස සලකා බලමින් අනාගත ව්‍යාපාරික කටයුතු සාර්ථක කර ගැනිමට අවශ්‍ය තීරණ ගැනිම , ඒවා වැඩිදියුණු කිරිම හා ඊට අවශ්‍ය උපාය මාර්ග තීරණය කොට ක්‍රියාත්මක කිරිම වැනි කාර්යයන් කිරිමට ව්‍යවසායකයාට ඇති හැකියාවයි

4) * බොහෝ සාර්ථක මහා පරිමාණ ව්‍යාපාර වල ආරම්භක අවස්ථාව කුඩා පරිමාණ ව්‍යාපාර වීම

   * ව්‍යවසායකයින්ට නිර්මාණශිලි කුසලතා ප්‍රායෝගිකව පහසුවෙන් භාවිතා කළ හැකි සහ ඒ තුළින් නවොත්පාදන බිහිවීම

   * වෙළෙඳපොල හිදැස හදුනාගෙන ව්‍යාපාර අවස්ථා සදහා පිවිසිය හැකිවීම

5) ගණුදෙනු නිවැරදිව වාර්තා කිරිම

   යහපත් මානව සම්බන්ධතා පවත්වාගැනිම

06.

1) ව්‍යාපරය සතු ශක්තීන් හදුනාගැනිමට හැකිවීම

   පරිසරයේ පවතින විවිධ ව්‍යාපාර අවස්ථා හදුනාගැනිමට හැකිවීම

2) පොලි අනුපාත ඉහළ යාම

   මිල මට්ටම් වෙනස් වීම

   සේවා වියුක්තිය ඉහළ යාම

3) තෘතියික අංශයට අයත් වන්නේ – ව්‍යාපාර කටයුතු සදහා මෙන්ම ජනතාවට අවශ්‍ය සේවා සැපයීමේ නිරතවන අංශයයි. එනම් තොග හා සිල්ලර වෙළෙඳාම බැංකු , ප්‍රවාහන සන්නිවේදනය වැනි යටිතල පහසුකම්ය මෙවැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරිම නිසා ව්‍යාපාර වලට අවශ්‍ය කටයුතු සිදු කිරිම ඉතා පහසු හා වාසිදායක වේ. ව්‍යාපාර අංශවල සංවර්ධනයට මෙම සේවා මනා පිටිවහලක් වේ

4) නව ජාත්‍යන්තර වරායක් ඉදි කිරිම

   ලොරි ට්‍රක් හා කන්ටේනර් සේවා

   ආහාර පාන වරායට පැමිණෙන සේවකයන්ට ආහාරපාන ලබාදිමේ අවන්හල

දිලිර රෝගයක් හේතුවෙන් පොල් එලදාව අඩුවීම ජෛව කෘමි නාශක නිෂ්පාදනය හා අලෙවිය

ඉහළ ගුණත්වයෙන් යුත් බීජ ලබාදීමේ සේවාව

5) ගෝලීය ව්‍යාපාර පරිසරය

   ලොවපුරා රටවල් දේශ සීමා වන්නේ තොරව බද්ධ වි කටයුතු කිරිමේ ප්‍රවණතාවය ගෝලීය ව්‍යාපර පිරිසරයකි

   උදා – අන්තර් ජාතික වෙළෙඳ පොළට පිවිසිමේ හැකියාව වැඩිවීම

**පිළිතුරු පත්‍රය**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 2 | 21. | 1 |
| 2. | 3 | 12. | 4 | 22. | 1 |
| 3. | 4 | 13. | 1 | 23. | 3 |
| 4. | 3 | 14. | 3 | 24. | 1 |
| 5. | 1 | 15. | 3 | 25. | 2 |
| 6. | 2 | 16. | 1 | | |
| 7. | 1 | 17. | 3 | | |
| 8. | 3 | 18. | 1 | | |
| 9. | 4 | 19. | 4 | | |